Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

විෂය -චිත්‍ර කලාව

කාර්ය පත්‍රිකා : අංක-41

13 ශ්‍රේණිය - පලමු වාරය

සැකසුම : කේ.නදීකා ප්‍රියදර්ශනි, ර/ ශ්‍රී රාහුල මහා විද්‍යාලය.

**නිපුනතාව** - 7.0 දේශීය විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටපයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණයේදී භාවිතයට ගනී.

නිපුනතා මට්ටම - යාපහුවේ වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම - 7.1.1 යාපහුවේ වාස්තු විද්‍යා නිර්මාණ අගයමු.

❖ ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

1) යාපහුවේ රජ මාළිගා සහ බලකොටු ආදිය නිර්මාණය කර ඇත්තේ,
   i. හතර වන බුවනෙකබාහු රජු විසිනි
   ii. තුන් වන වික්‍රමබාහු රජු විසිනි.
   iii. සුභ නැමැති සෙනෙවියා විසිනි.
   iv. පළවන බුවනෙකබාහු රජු විසිනි.
   v. සේනාධිලංකාර ඇමතියා විසිනි.

2) වංශ කතාවල සඳහන් පරිදි යාපහුව වාස්තු විද්‍යා සංකීර්ණය ගොඩ නැගීමේ මූලික අරමුණ වී ඇත්තේ,
   i. රජුගේ ආරක්ෂාව පිණිස තැනූ බලකොටුවක් ලෙසය.
   ii. රජුගේ ප්‍රෞඪත්වය ලොවට කියා පෑමටය.
   iii. වන්දනාමාන කටයුතු සඳහා කළ සිද්ධස්ථානයක් ලෙසටය.
   iv. රජු සඳහා ඉදි කළ මාළිගා සංකීර්ණයක් ලෙසටය.
   v. දළදාව සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමටය.

3) යාපහුව මාළිගය සහ බලකොටුව ඉදි කරන ලදැයි සැළකෙන්නේ,
   i. ක්‍රි.ව 1273 දීය.
   ii. ක්‍රි.ව 1344 දීය.
   iii. ක්‍රි.ව 1400 දීය
   iv. ක්‍රි.ව 5වන සියවසේදීය.
   v. ක්‍රි.ව 10 වන සියවසේදීය.

4) යාපහුව කැටයම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   i. බහු මාධ්‍යයන් භාවිතය
   ii. කැටයම් සඳහා උද්භිද සැරසිලි පමණක් භාවිතය
   iii. අල්පෝන්නත කැටයම් පමණක් දැකිය හැකි වීම
   iv. දකුණු ඉන්දීය කලා ලක්ෂණ සහිත වීම.
   v. උළුවහු කැටයම් දැවයෙන් නිමකර තිබීම.

5) යාපහුවේ ද්වාර මණ්ඩපය ආශ්‍රිතව දක්නට නොහැකි කැටයම් අංගයකි.
   i. මණ්ඩප පාදම කැටයම්
   ii. කුළුණු කැටයම්
   iii. පරාල කැටයම්
   iv. උළුවහු කැටයම්

v. වා කවුළු කැටයම්

❖ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී දී ඇති රූප උපයෝගී කර ගන්න.

- නිවැරදි අක්ෂරය තිත් ඉරි මත ලියන්න.



A



B



C



D



E

6) …………අක්ෂරයෙන් දැක්වෙන කැටයම වා කවුළු වලට ඉහළින් දැක ගත හැකිය.

7) මනංකල්පිත සත්ව රුවක් සහිත කැටයමක් …………….අක්ෂරයෙන් දැක්වේ.

8) …………….. අක්ෂරයෙන් දැක්වෙන කැටයම පළමු පියගැටපෙළ අවසානයේ දැක ගත හැකිය .

9) ……………… අක්ෂරයෙන් දැක්වෙන්නේ ද්වාර මණ්ඩපයේ පාදමේ ඇති ඉතා වැදගත් නිර්මාණයකි.

10) ……………… රූපයෙන් දැක්වෙන කැටයමේ මූලික ආකෘතිය මුරගල් වල නාගරාජ ඉරියව්වට සමාන වේ.

## දෙවන කොටස - චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය

1) යාපහුවේ ශේෂව ඇති ඉදි කිරීම් දෙස බැලීමේදී ඒවා ප්‍රධාන අරමුණු 3 ක් යටතේ ඉදි කර තිබේ. ඒ මොනවාද ?

2) යාපහුවේ දැකිය හැකි සුවිශේෂ කැටයම් නිර්මාණ නම් කරන්න.

3) යාපහුවේ අනන්‍යතාව කියා පාන "යාපහුව සිංහයා" කැටයම පිළිබඳ කෙටි කලා ඇගයීමක් කරන්න.

4) යාපහුව ශිල්පියාගේ මානව රූ නිරූපණයේ විශිෂ්ටත්වයට උදාහරණ පහදන්න.

5) උදාර හෙළ උරුමයක් වූ යාපහුව රාජධානියේ ද සීගිරිය බඳු බලකොටුවක් නිර්මාණය කිරීමටඋත්සාහ දරා ඇති ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න.